## නියාගම ප්‍රාදේශීය සභාව
## 2027 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් 2026.11.30 දින ප.ව.3.00 දක්වා භාරගනු ලැබේ.

**සැපයුම්**

| | | | |
|---|---|---|---|
| 01 | කාර්යාලයීය උපකරණ (වානේ, ප්ලාස්ටික් හා ලී බඩු) | 10 | ක්‍රීඩා උපකරණ. |
| 02 | ලිපි ද්‍රව්‍ය සැපයීම, ටෝනර් වර්ග | 11 | රසායනික ද්‍රව්‍ය හා පොහොර |
| 03 | විදුලි උපකරණ (වීථි පහන් උපකරණ, ෆ්ලෑෂ් ලයිට්) | 12 | පරිගණක, ෆැක්ස්, ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ මැෂින් හා එම උපාංග |
| 04 | සියලුම ගොඩනැගිලි ද්‍රව්‍ය (ගල්, වැලි, සිමෙන්ති, කම්බි, සෙවිලි තහඩු, යකඩ...) | 13 | වාහන අමතර කොටස් |
| 05 | කොන්ක්‍රීට් උපකරණ හා සිමෙන්ති නිෂ්පාදන. | 14 | සමරු ඵලක සැපයීම. |
| 06 | නිල ඇඳුම් මසා සැපයීම. | 15 | ශබ්ද විකාශන යන්ත්‍ර අනෙකුත් ශබ්ද උපාංග සැපයීම (මයික්, ඇම්ප්, බෆල්,මික්සර්..) |
| 07 | පී.වී.සී. පයිප්ප බට, ජලනල උපකරණ හා ඉදිකිරීම් ද්‍රව්‍ය | 16 | පෙර පාසල් උපකරණ |
| 08 | නඩත්තු වැඩ සඳහා අවශ්‍ය උපකරණ හා යන්ත්‍රෝපකරණ | 17 | සනීපාරක්ෂක උපකරණ |
| 09 | නාම පුවරු, දැන්වීම් පුවරු සහ බැනර් ඇතුළු මුද්‍රණ කටයුතු | 18 | ආදාහනාගාරය සඳහා ගෑස් සැපයීම |

**සේවා**

| | | | |
|---|---|---|---|
| 01 | වාහන හා යන්ත්‍ර අලුත්වැඩියා හා සේවා කිරීම (ට්‍රැක්ටර්, කැබ් රථ, JCB යන්ත්‍රය, ගල්රෝල, බවුසරය, කොන්ක්‍රීට් මිශ්‍රණ) | 07 | අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම |
| 02 | පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස්, රෝනියෝ මැෂින් අලුත්වැඩියාව හා සේවා කිරීම | 08 | මඩු, පුටු, තිරරෙදි ඇතුලු උත්සව භාණ්ඩ සැපයීම |
| 03 | මුද්‍රණ සේවා (දින මුද්‍රා / රබර් මුද්‍රා) | 09 | ශබ්දවාහිනී සේවා සැපයීම. |
| 04 | වායුසමීකරණ අලුත්වැඩියාව හා සේවා කිරීම | 10 | ආදාහනාගාරය සේවා කිරීම |
| 05 | ප්‍රවාහන සේවා | 11 | වැඩසටහන් සඳහා ආහාර සැපයීම |
| 06 | නොතාරිස් හා නීතිඥ සේවා | | |

**කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කිරීම.**

| අනු අංකය | මුදල් සීමාව | ලියාපදිංචි ගාස්තු |
|---|---|---|
| 01 | රු.50,000.00 දක්වා | රු.500.00 |
| 02 | රු.50,001.00 සිට රු. 100,000.00 දක්වා | රු.1250.00 |
| 03 | රු.100,001.00 සිට රු. 250,000.00 | රු.1500.00 |
| 04 | රු. 250,001.00 සිට රු. 500,000.00 | රු.1750.00 |
| 05 | රු. 500,000.00 ට වැඩි | රු.2000.00 |

**කොන්දේසි.**

01. සැපයුම් හා සේවා සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුව එක් අයිතමයක් සඳහා **රු.500.00** කි. එම මුදල **සභාපති, නියාගම ප්‍රාදේශීය සභාව** යන නමට රේඛිත චෙක්පතකින් හෝ බැංකුවට සෘජුව තැන්පත් කිරීම හෝ කාර්යාල වේලාවන් තුළදී මුදලින් ගෙවීම් කල හැකිය. බැංකුවට සෘජුව තැන්පත් කරන්නේ නම් ඒ සඳහා වන ක්‍රමවේදය කාර්යාලයීය දුරකථන අංකයෙන් හෝ niyagamaps@gmail.com යන විද්‍යුත් ලිපිනයෙන් විමසීමෙන් ලබා ගත හැකිය.

02. අයදුම්කරු විසින් එක් එක් අයිතමය සඳහා වෙන වෙනම ගාස්තු ගෙවීම හා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම කළ යුතුය.ව්‍යාපාරයේ නම, සැපයීමට අපේක්ෂිත භාණ්ඩය හෝ සේවාව, මුදල් ගෙවීම් කරන ආකාරය යනාදිය ඇතුලත් කල තමා විසින් පිළියෙල කරන ලද අයදුම්පතක් සමග ලියාපදිංචි අංකය සහිත සහතික පත, වැට් බදු ලියාපදිංචි කරුවකු නම් ඊට අදාල සහතික පත අමුණා ලිපි කවරයේ වම් පස ඉහල කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2027"** යන්න සඳහන් කර **2026.11.30** දින හෝ ඊට පෙර **ලේකම්, නියාගම ප්‍රාදේශීය සභාව, නියාගම, තල්ගස්වල.** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

03. ඇණවුම් ලැබී දින 07 ක් ඇතුලත ඇණවුම් කරන ලද භාණ්ඩ හා සේවා ලබා දියයුතු අතර, මිළ ගණන් ඉදිරිපත් නොකරන්නා වූද, ඇණවුම් කරනවිට සාම්පල් අනුව භාණ්ඩ හා සේවා නොසපයන්නාවූ ද සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.

04. ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ මිළ ගණන් අඩු වශයෙන් මාස 06ක කාලයක් ස්ථාවරව තබාගත යුතු අතර, අවශ්‍යයැයි හැඟෙන අවස්ථාවල දී බාහිර සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ සේවා ලබා ගැනීමේ අයිතිය සභාව සතු වේ.

05. කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වීමට ඉල්ලුම් කරන අය අවශ්‍යතාව අනුව හැකියා සහතිකය ඉදිරිපත් කළ යුතු අතර ගාල්ල දිස්ත්‍රික්කය තුළ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ. (වැඩි විස්තර කාර්යාලයීය වේලාවන් තුළදී **0912296518** දුරකථන අංකයෙන් හා www.niyagama.ps.gov.lk මගින් ලබා ගත හැකිය.)

2026.09.29 වන දින
නියාගම ප්‍රාදේශීය සභාව.

එන්.අයි.මාලිමගේ
ලේකම්
නියාගම ප්‍රාදේශීය සභාව